සබරගමුව පළාත් සභාව -2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සබරගමුව පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 27 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
	-------------------------	--------------------------	-------------
(අ)	සබරගමුව පළාත් සභාව යටතේ පවතින ආයතන වල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේදී අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 08ක ජංගම නොවන වත්කම් රු.235,085,806ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ පළාත් සභා අරමුදල් ගිණුමේ ජංගම නොවන වත්කම් වටිනාකම ද එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව,	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු අතර නිසි අධීක්ෂණයක් පවත්වා ගත යුතු ය.
(ආ)	සබරගමුව පළාත් සභාව විසින් ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ පවත්වාගෙන යන දෛනික තැන්පතු කළමනාකරණ ගිණුම් සඳහා 2025 ජනවාරි 01 දින හා 2025 ජනවාරි 03 දින ලැබී තිබුණු බැංකු බැර	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කර සංසන්දනාත්මක ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු අතර, නිසි අධීක්ෂණයක් පවත්වා ගත යුතු ය.

	නිවේදන අනුව 2024 දෙසැම්බර් මාසයට අදාල පොලී ආදායම වූ රු.12,110,550 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු පොලී ආදායම් ලෙස දක්වා නොතිබීමෙන් ඌණතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		
(ඇ)	සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති 429.4 ට පටහැනි ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය 2017 වර්ෂයේ සිට සේවා ගාස්තු ලැබීම් හා සේවා සැපයීමට අදාළ වියදම්, ආදායම් හා වියදම් වශයෙන් හඳුනා නොගෙන පොදු තැන්පත් ගිණුම මඟින් ගැලපීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට සමුච්ඡිත අරමුදල රු.13,706,684 කින් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.2,450,705 කින් අඩුවෙන්ද දක්වා තිබුණි.	2026 වර්ෂයේ සිට ලැබෙන මුදල් ආදායම් ලෙසත් ඒ යටතේ සිදුකරන ගෙවීම් වියදම් ලෙසත් අයවැය ලේඛනයට ඇතුලත් කර ප්‍රතිපාදන සලසා ගැනීමට පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ඇති බව.	පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් සභාව යටතේ ඇති සියළු අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල ආදායම හා වියදම නිවැරදිව ගිණුම්ගත කිරීම සම්බන්ධ නිසි අධීක්ෂණයක් කළ යුතු ය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දී 48 වන ජාතික ක්‍රීඩා තරඟාවලියේ තරඟ පැවැත්වීම සඳහා පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මධ්‍යම රජයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව රු.4,575,000 ක් ලබා දී තිබියදී, දෙපාර්තමේන්තුවේ වැය විෂයය මඟින් වියදම් දරා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.4,575,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.	එම මුදල් තැන්පත් ගිණුමෙන් 2025 මාර්තු 28 දින පළාත් සභා ආදායමට බැර කිරීමට කටයුතු කළ බව.	මධ්‍යම රජයෙන් ලැබුණු මුදලින් දරනු ලබන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය.
(ඉ)	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පිළිවෙලින් රු.7,170,000 ක් සහ රු.1,382,233ක් වශයෙන් එකතුව රු.8,552,233 ක් වූ බැරකම් ශේෂයන් ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබීමෙන් පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඌණතාවය සහ උපචිත වියදම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	තිළිණ ප්‍රදානෝත්සවය 2024 දෙසැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර තිබුණි. මෙම තිළිණ ප්‍රදානෝත්සවය 2025 ජනවාරි මස පැවැත්වීමට පසුව තීරණය කරන ලදී. 2024 වර්ෂයේ ජාතික ක්‍රීඩා තරඟාවලියේ ජයග්‍රහන පදනම් කරගෙන සකස් කර ඇති බැවින් මෙම වියදම් බැරකම් ප්‍රකාශය තුළ ඇතුළත් කර නොමැති බව.	බැරකම් ඇති වූ වර්ෂය පදනම් කර ගෙන ගිණුම් ගත කළ යුතු ය.
(ඊ)	ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව 2024 දෙසැම්බර් 31 දිනට හිඟ දීර්ඝකාලීන බදු ආදායම රු.62,481,121 ක් ද හිඟ වාර්ෂික බදු ආදායම රු.56,678,907 ක් ද විය. එසේ වුවද සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම්	අදහස් දක්වා නොතිබුණි.	1. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන සම්බන්ධීකරණය කරමින් නිවැරදි හිඟ බදු වටිනාකම පිළිබඳව තොරතුරු පවත්වා

	කොට්ඨාශ 29 ක් අතුරින් නියැදියක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් පරීක්ෂාවේදී 2024 දෙසැම්බර් 31 දිනට හිඟ දීර්ඝකාලීන බදු ආදායම රු.76,260,658 ක් හා හිඟ වාර්ෂික බදු ආදායම රු.37,341,461 ක් වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමෙහි නිවැරදිතාවය පිළිබඳ විගණනයට සෑහීමට පත්විය නොහැක.		ගත යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්විය යුතු ය. 2. හිඟ බදු කඩිනමින් අයකිරීම සඳහා අදාල ක්‍රියාමාර්ග ගත යුතු අතර, බදු නොගෙවන්නන් සම්බන්ධයෙන් අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(උ)	පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 07 ක ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුද සම්පූර්ණ වී නොතිබුණි. පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ ද එම වත්කම් ඇතුලත්කර නොතිබුණු අතර උචිත පරිදි අදාල හෙළිදරව් කිරීම් ද සිදුකර නොතිබුණි.	2025 වර්ෂය අවසන්වීමට පෙර එම වත්කම් නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දී ඇති බව.	ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන කළමනාකාරීත්වය සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 800 - ආණ්ඩුකාරවර කාර්යාලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	----------------------------------	-------------
ආණ්ඩුකාර සුව මෙහෙවර” වැඩ සටහන යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව ඇස් කණ්ණාඩි 3600 ක් කෑගල්ලේ පිහිටි පුද්ගලික ආයතනයකින් ආණ්ඩුකාරවර අනුමැතිය පරිදි 2024 වර්ෂයේ	ඇස් කණ්නාඩි බෙදා හැරීමට මෙම කාර්යාලයේ නිලධාරීන් යෙදවීම ප්‍රායෝගිකව අපහසු බැවින් පූර්වගාමී ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි	1. රජයේ මුදල් වැය කිරීමේ දී අදාල මූල්‍ය රීති / ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

අවස්ථා 02 ක දී රු.1,080,000 ක් වැයකර මිල දී ගෙන තිබුණි. මෙම ඇස් කණ්නාඩි තොගය සැපයුම්කරු විසින් ආණ්ඩුකාරවර කාර්යාලයේ ගබඩාවට භාරදීමත් එමඟින් නිකුත් කිරීමත් සිදු වී නොතිබු අතර, සපයන ලද ප්‍රමාණය නිවැරදි ද යන්න තහවුරුවක් නොමැතිව බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි. තවද, මෙම ඇස් කණ්නාඩි තොගයෙන් කණ්නාඩි 358 ක් කෑගල්ල දිස්ත්‍රික්කයේ සායනවලදී බෙදාහැර තිබු බවට අත්සන් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කළ අතර, රු.972,600 ක් වටිනාකමැති ඉතිරි කණ්නාඩි 3242 බෙදා හැර ඇති ආකාරය පිළිබඳව සාක්ෂි 2025 සැප්තැම්බර් දක්වාම විගණනයට ඉදිරිපත් නොවීය.	එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් මගින් අදාල බෙදාහැරීම් කටයුතු සිදුකර ඇතිබව. මෙම භාණ්ඩ ප්‍රදාන වශයෙන් ලබා දීමට මිලදී ගනු ලබන භාණ්ඩ බැවින් ගබඩාව වෙත භාරගැනීමක් සිදුකර නොමැත . ගරු ආණ්ඩුකාරතුමා ගේ උපදෙස් පරිදි අදාල ගෙවීම් කටයුතු සිදුකර ඇතිබව.	අනුගමනය කළ යුතු ය. 2. තහවුරු කරගත නොහැකි කණ්ණාඩි සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා අදාල පරීක්ෂණ පැවැත්විය යුතු ය.

1.5.2 ශීර්ෂය 801 - පළාත් සභා ලේකම් කාර්යාලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	------------------------------	-------------
පළාත් සභා මන්ත්‍රී නිල නිවාසය ඉදිකර ඇති ඉඩම 2025 ජුනි 27 දින වන විටත් ප්‍රධාන ලේකම් වෙත පවරා ගෙන නොතිබුණි.	මෙම ඉඩම සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) වෙතින් විමසා ඇති අතර, එයට පිළිතුරු ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	ඉඩම පවරාගැනීම සඳහා කටයුතු කළ යුතු ය.

1.5.3 ශීර්ෂය 802 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
ශීර්ෂය 803 - සමූපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	------------------------------	-------------
1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපතිවරයා නිල වාහනයක් හිමි තනතුරක් යටතට ඇතුලත්ව නොතිබුණ අතර දෛනිකව රාජකාරී සඳහා වාර්තා කිරීමට අවශ්‍යතාවක් නොමැති නමුදු මසකට දින කිහිපයක් පවත්වන කොමිෂන් සභා රැස්වීමට ප්‍රවාහන පහසුකම් හෝ ඒ වෙනුවට දීමනා ගෙවීමට කටයුතු කල හැකි වුවද, ඔවුන් වෙත ද ඉන්ධන සමඟ නිල වාහනයක් ලබා දී තිබුණි.	ආණ්ඩුකාර ලේකම්ගේ අංක ආකා:10/3/17I-II හා 2007.06.27 දිනැති ලිපියෙහි උපදෙස් පරිදි සභාපතිවරුන්ට රජයේ වාහනයක් ලබාදී ඇති බව.	ගණන් දීමේ නිලධාරීන් විසින් පවත්නා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, වත්කම් අවභාවිතයන් වැළැක්වීමට කටයුතු කළ යුතු ය.

1.5.4 ශීර්ෂය 804 – පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව පැවති පැරණි වාහන 10 ක පැවැත්ම තහවුරු කරගත නොහැකි වූ අතර, තවත් වාහන 05ක් 1993 සහ 1999 වර්ෂයන් හි වෙන්දේසි කර තිබූ බව වාර්තාවී තිබුණද ඊට අදාල තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. එසේම අබලි වාහන 04 ක් වෙන්දේසි කිරීමට කටයුතු නොකිරීමෙන් තවදුරටත් දිරාපත් වෙමින් පැවතුණි.	1993 දී වෙන්දේසි කර ඇති බව, ගිනි ගැනීමෙන් විනාශ වී ඇති බව, දිරාපත් වී ගොස් ඇති බව, අබලි කොටස් ලෙස පවතින බව ක්‍රියාන්විත රාජකාරි සඳහා භාර දුන් පසු තොරතුරු නොමැති බව සහ තවදුරටත් තොරතුරු සොයා බලා වාර්තා කරන බව.	වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කළ යුතු අතර, පැවැත්ම තහවුරු කරගත නොහැකි වාහන සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්විය යුතු ය.
(ආ)	සබරගමුව පළාත් මූල්‍ය රීති 76.2.5 ප්‍රකාරව පළාත් සභාව සතු වූ හෝ පළාත් සභාව භාරයේ පවත්නා වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් විධිමත් විධි විධාන යොදවනු ලබන බවට ගණන් දීමේ නිලධාරීගේ වගකීම වුවත් ගණන් දීමේ නිලධාරීන් විසින් නියමිත කාල සීමාවන් තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග නොයෙදීමේ හේතුවෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහ ප්‍රධාන අමාත්‍යාංශයේ වාහන අනතුරු දෙකකට අදාළ අළුත්වැඩියා කටයුතු සඳහා වැයකළ රු.13,945,278 ක වටිනාකමක් රක්ෂණ වන්දි ලෙස අදාල රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට නොහැකිව තිබුණි.	රක්ෂණ වන්දි ලබාගැනීම සඳහා කටයුතු ඉදිරියට සිදුකරමින් පවතින බව.	රජයට සිදු වී ඇති අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	සබරගමුව පළාත් සභාවේ 2019-2023 කාලසීමාවට අදාල පස් අවුරුදු දැක්මකට දිශානත වූ ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේ දි රු.28,353,251 ක විදේශාධාර වැය කර සකස් කර අනුමත කර තිබුණි. එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2025 ජූලි 20 දින දක්වාම සකස් කර නොතිබුණි. එහි පළාත් ආදායම් රැස් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ ව්‍යාපෘති අධීක්ෂණය සඳහා වෙබ් පාදක පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පළාත් ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කිරීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් තුන සඳහා රු.11,711,620 ක් වැය කර තිබූ නමුත් එම ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක කර නොතිබුණි. සැලැස්මේ අනෙකුත් ක්‍රියාකාරකම්	පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාල අදාල පද්ධති සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණ ද ඒ සඳහා පුහුණු වීම් සහ උපාංග ලබාගෙන ඇති බව.	1. පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් සකස් කිරීමෙන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස්කර එහි ප්‍රගතිය වාර්ෂිකව පරික්ෂා කළ යුතු ය. 2. ලබාගෙන ඇති උපාංග ප්‍රයෝජනයට ගෙන පද්ධති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

ආයතන විසින් ඉටුකරනු ලබන සාමාන්‍ය ක්‍රියාකාරකම් වූ බැවින් රු. මිලියන 28 කට අධික මුදලක් වැය කර සකස් කර තිබූ පස් අවුරුදු සැලසුම් සඳහා දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.

1.5.5 ශීර්ෂය 809 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති රු.111,493,172 ක් වූ හිඟ ආදායමෙන්, එකතුව රු.5,465,896 ක හිඟ ආදායම වසර 10 - 23ත් අතර ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවතෙමින් එන ශේෂයක් වූ අතර, රු.1,156,440 ක හිඟ ආදායම වසර 05 - 10ත් අතර කාලයක සිට පැවතෙන ශේෂයක් විය.	සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 01 – 05 ත් අතර පැවති රු.104,870,834 ක් වූ හිඟ ආදායම රු.63,514,871 දක්වා රු.41,355,963 කින් අඩු කර ගැනීමට සමත් වී ඇති බව.	විධිමත් සැලැස්මකට අනුව කඩිනමින් හිඟ ආදායම් අයකළ යුතු ය.

1.5.6 ශීර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු පළාත් අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වල නිසි අවශ්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 වර්ෂයේ දී රු. 58,308,411 ක් වැය කර කම්පැක්ටර් යන්ත්‍ර 14 ක් මිලට ගෙන සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 14 ක් වෙත බෙදාහැර තිබූ නමුත් එම යන්ත්‍ර මාර්ගවලට යෝග්‍ය නොවන නිසා එකී යන්ත්‍ර භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි.	එක් යන්ත්‍රයක් භාවිතයට ගන්නා බවත්, භාවිතයට ගත නොහැකි යන්ත්‍ර 03 ක් ප්‍රධාන ලේකම් වෙත භාරදී ඇති බවත්, යන්ත්‍ර 04ක් සාමාන්‍ය ටේලර් බවට පත් කිරීමට කටයුතු කරමින් පවතින බවත්, යන්ත්‍ර 06 ක් ධාවනයෙන් ඉවත් කර ඇති බව.	1. අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් මිලදී ගැනීම් සිදුකළ යුතු අතර අවිධිමත් මිලදී ගැනීම් සම්බන්ධ වගකිවයුත්තන්ට එරෙහි ක්‍රියාමාර්ග ගත යුතුය. 2. නිෂ්කාර්ය වත්කම් උපයෝජනය සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2006 පරිදි ප්‍රසම්පාදන කටයුතු කළයුතු වුවත්, අධ්‍යාපන අමාත්‍යාංශය හා ප්‍රධාන අමාත්‍යාංශය ඊට පටහැනිව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත රු.472,838,470 ක්	ගරු ආණ්ඩුකාරවරයාට පළාත් සභා මූල්‍ය රීති ප්‍රකාරව ලංසු තැබීමකින් තොරව පළාත් සභාව යටතේම පාලනය වන මෙම සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ඉදිකිරීම් කර්මාන්තය පැවරීමට නියෝග කිරීමට	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව රජයේ ආයතන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු ය.

	වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 41 ක් පිරිනමා තිබුණද එකී අධිකාරිය වෙත ප්‍රමාණවත් ඉංජිනේරුවරුන් නොමැති වීම මත එකී අධිකාරියද එම කොන්ත්‍රාත් ඉටු කිරීමේදී භාහිර පාර්ශවයන් වෙත උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.	බලය පවතී. ඒ අනුව කටයුතු කර ඇත.	
(ඇ)	ප්‍රධාන අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන සඳහා සූර්ය බල වීථි ලාම්පු ලබා දීමට එම ආයතනවල අවශ්‍යතාවයට ගැලපේ ද යන්න පූර්ව විමසීමකින් තොරව අඛණ්ඩව පැය 01 විනාඩි 20 ක් දැල්වෙන වොට් 90 එල්ඊඩී සූර්ය බල වීථි ලාම්පු 1,500 ක් මිලදී ගැනීමට 2023/2024 වර්ෂයේ දී ලංසු කැඳවා තිබුණි. තවද, එකම ලංසුකරු ලංසුපත් දෙකක් ඉදිරිපත් කිරීම, තෝරාගත් සැපයුම්කරු සෝලා විදුලි ලාම්පු ආනයනකරුවෙකු නොවීම හා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම සහ සැපයුම්කරුගේ මූල්‍යමය ශක්‍යතාවය යන තත්ත්වයන් හඳුනාගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් අදාල පරිදි කටයුතු කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.3 අනුව භාණ්ඩ භාර ගැනීමට පෙර අදාල පිරිවිතරවලට ගැලපේද යන්න විධිමත්ව පරික්ෂා කිරීමකින් තොරව ලාම්පු 1,500 ක් එකක් රු. 19,500 බැගින් එකතුව රු. 29,250,000 ක මුදල් ගෙවීමේ පදනමින් වසර 02 ක වගකීම් කාලයක් සහිතව ලබා ගෙන තිබුණි. විගණනය විසින් විමසීම් කළ පසු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු පීඨය මඟින් සිදුකරන ලද රසායනාගාර පරික්ෂාවේදී සැපයුම්කරු විසින් පිරිවිතරවලට නොගැලපෙන ලාම්පු සපයා තිබූ බව තහවුරු කර තිබුණි. වීථි ලාම්පු පළාත් පාලන ආයතන වෙත බෙදාහැරිය ද අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් නැවත අමාත්‍යාංශයට ලබා ගෙන ගබඩා කර ඇති අතර සැපයුම්කරුට දැනුම් දුන්නද ඒවා නැවත රැගෙන යාමට	සැපයූ වීථි ලාම්පු පිරිවිතරවලට අනනුකූල බැවින් සැපයුම්කරු වෙත මෙම වීථි ලාම්පු ආපසු රැගෙන ගොස් පිරිවිතරවලට අනුකූලව සැපයීමට කටයුතු කරන ලෙස දන්වා අවස්ථා 02 කදී ලිපි යවා ඇති බවත්. පිරිවිතරයන්ට අනුව මෙම වීථි ලාම්පු සැපයීමට අදාල සැපයුම්කරු කටයුතු කරන්නේ නම් ඉන් පසු ගෙවීම් කිරීම සඳහා පළාත් පාලන ආයතන 07 කින් ලබා ගත් මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති බවත්. මෙම කාරණාව සම්බන්ධයෙන් නීති අංශයෙන්ද උපදෙස් ඉල්ලා ලිපියක් යොමු කර ඇති බව.	1. අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පිරිවිතර සකස් කළ යුතු ය. 2. තාක්ෂණික ඇගැයීම් ක්‍රියාවලියේදී ඇගැයීම් නිර්ණායක පිළිබඳව නිවැරදි තාක්ෂණික ඇගයීමක් සිදුකළ යුතු අතර, භාණ්ඩ භාර ගැනීමට පෙර සුදුසු පරීක්ෂණ මගින් සපයන භාණ්ඩ පිරිවිතර වලට අනුකූලද යන්න තහවුරු කර ගත යුතු ය. 3. ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් සම්බන්ධයෙන් අදාල පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

	හෝ පිරිවිතරවලට ගැලපෙන ලාම්පු සැපයීමට හෝ 2025 සැප්තැම්බර් දක්වා කටයුතු කර නොතිබුණි.		
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ 76.1.1 රීතිය අනුව තම අමාත්‍යාංශය යටතේ වන සියලුම දෙපාර්තමේන්තුවල, අධිකාරිවල සහ ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ප්‍රධාන ලේකම්වරයා මඟින් ආණ්ඩුකාරවරයාට වගකිව යුතු වන්නේය. නමුත් පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින්, සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සම්බන්ධයෙන් 2022 ජනවාරි මාසයේ නිකුත් කළ මූලික විමර්ශන වාර්තාව මඟින් හඳුනාගෙන තිබූ මූල්‍යමය පාඩු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම හා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම 2024 දෙසැම්බර් 31 දින වන විටත් සිදුවී නොතිබුණි.	මූලික විමර්ෂණයෙන් පෙන්වා දී ඇති ආයතනික මට්ටමින් අය කරගත හැකි සියළුම අය කර ගැනීම් සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් අය කරගෙන අවසන් බවත්, නිර්දේශ අංක 23 ට අදාලව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවේ තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කරන බවත් අංක 52 ට අදාලව පත් කරන ලද කමිටුවේ වාර්තාව ලද විගස වැටුපෙන් අය කර ගැනීමටත් පාරිතෝශිත මුදලින් අය කර ගැනිමටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පවතින බව.	1. ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් මූල්‍ය රීති ප්‍රකාරව තම වගකීම් ඉටු කළ යුතු අතර හඳුනාගෙන ඇති මූල්‍යමය පාඩු අප්‍රමාදව අය කර ගත යුතුය. 2. අධිකාරියේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා සුදුසු පාලන ක්‍රම ස්ථාපිත කොට පවත්වා ගත යුතු ය.
(ඉ)	ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව ප්‍රධාන අමාත්‍යාවරයාට වාහන 03ක් වෙනුවෙන් හිමි මාසික ඉන්ධන දීමනාව ලීටර් 1700ක් සඳහා 2014 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් දක්වා රු.9,850,170 ක් ගෙවා තිබියදී සාවද්‍ය නිර්දේශ මත ගනු ලැබූ 2014 ජුලි 02 දිනැති අංක 2014/60 සහ 2014/61 දරන සබරගමුව පලාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව ප්‍රධාන අමාත්‍යවරයාට සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියෙන් මාසිකව ඉන්ධන ලීටර් 1500 ක් හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් ලීටර් 1500 ක් බැගින් අනුමතකර 2014 ජූලි සිට 2017 සැප්තැම්බර් දක්වා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියෙන්	ප්‍රධාන අමාත්‍යතුමාගේ 2014.07 දින රහිත ලිපියේ ඉල්ලීම පරිදි ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කලමනාකරණ) ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2014.07.02 දින අනුමැතිය ලැබී ඇති බවත්, රජයට යම් අලාභයක් සිදුව ඇත්නම් ඒ පිළිබඳව සොයා බැලීමට මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු ය.

එකතුව රු.5,319,864 ක් ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් එකතුව රු.5,329,112 ක් ද වශයෙන් මුළු එකතුව රු.10,648,976 ක් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉන්ධන දීමනා ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, හිටපු ප්‍රධාන අමාත්‍යවරයා විසින් රු.10,649,476 ක් 2025 ඔක්තෝබර් 21 දින පළාත් සභා අරමුදලට බැර කර තිබුණි.

1.5.6.1 සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
දිගුකාලීනව අය නොවී පැවතුනු රු.මිලියනය ඉක්ම වූ ණයගැතියන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.7,732,141 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකරගෙන නොතිබුණි.	ණය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.	අයවිය යුතු ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

1.5.6.2 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	අධිකාරියේ කැබ් රථයක් 2022 මාර්තු මාසයේ අනතුරකට පත් වී තිබුණද, 2025 මැයි 15 දක්වාම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් කර නොතිබුණි. එමෙන්ම, රක්ෂණයෙන් ආවරණය නොවන රු.594,200 ක හානිය සම්බන්ධයෙන් වගකීම නිශ්චය කර නොතිබුණි.	වර්තමානයේදී මෙම කැබ්රථයට අදාළ මූලික විමර්ශන කටයුතු අවසාන වෙමින් පවතින බව.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන්කර අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතු ය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට හිඟ ලොග්පත්‍ර ආදායම රු. 9,451,725 ක් වූ අතර ඉන් රු.7,425,050 ක් මාස 13 - 53ත් අතර කාලයක සිට පැවත එන බස්රථ 108 කින් ලැබිය යුතු හිඟ ශේෂයක් විය. එම මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	වර්තමානය වන විට මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට විධිවිධාන සලසා ඇති අතර සමහර ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව.	1. අයකර ගතහැකි උපරිම වටිනාකම් අයකර ගත යුතුය. 2. නිසි ක්‍රමවේදයක් අනුගමනය කර විධිමත් අනුමැතියකින් පොත් වලින් කපා හැරීම.

(ඇ)	අන්තර් පළාත් පිවිසුම් වෙනුවෙන් බස්රථ 70 කින් අයකළ යුතු ලෙස හදුනා ගත් පිවිසුම් ගාස්තු රු.4,097,450ක් හිඟව පැවති අතර ඉන් බස්රථ 49ක් වෙනුවෙන් රු.3,892,700ක් වූ පිවිසුම් ගාස්තු මාස 13 - 70ත් අතර කාලයක සිට හිඟව පැවතුණි.	වර්තමානය වන විට මෙම අයවැය ශේෂයන් අයකර ගැනීමට විධිවිධාන සලසා ඇති අතර සමහර ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව.	-එම-
(ඈ)	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2020 සිට 2024 දක්වා කාලය තුළ බස්රථ 138 කට නියම කරන ලද දඩ හා අධිභාර මුදල් රු. 1,358,350 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	වර්තමානය වන විට මෙම අයවැය ශේෂයන් අයකර ගැනීමට විධිවිධාන සලසා ඇති අතර සමහර ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව.	නියම කරන ලද දඩ හා අධිභාර මුදල් කාලීනව අයකල යුතු අතර, දක්වා ඇති හිඟ මාර්ග පරීක්ෂක දඩ ආදායම් හා අධිභාර කපා හැරීමේ කිසිදු ඉඩ ප්‍රස්ථාවක් නොමැත.
(ඉ)	කාර්යභාර නිලධාරී, කළමනාකරණ සහකාර, ස්ථානභාර නිලධාරී, රියදුරු, වේලා සටහන්කරු සහ මුරකරු යන තනතුරුවල අනුමත සංඛ්‍යාව ඉක්මවා වැඩිපුර 48 දෙනෙකු බඳවාගෙන තිබුණි.	පසුගිය විෂයභාර අමාත්‍යතුමා හෝ ආණ්ඩුකාරතුමාගේ බලය පරිදි බඳවා ගැනීම් සිදු වූ නමුත් මෙම සේවකයන් 48 දෙනා විසින් ආයතනයට සේවාවක් (පැවරූ රාජකාරි කටයුත්තක්) සිදුවන අතර 2024 සැප්තැම්බර් මස සිට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති බැවින් ඉදිරියට ඒ අනුව කටුයුතු කරන බව.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2024 ජනවාරි 16 දිනැති අංක DMS/SG/0505 දරන ලිපිය මඟින් අතිරික්ත තනතුරු අනුමත කිරීම සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බව දන්වා ඇති බැවින් අනුමත සංඛ්‍යාව ඉක්මවා රඳවා ගැනීමට කටයුතු කළ අය සම්බන්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඊ)	සබරගමුව පළාත් සභාවේ 1994 අංක 01 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 26 වන වගන්තිය අනුව පත්වීම් බලධරයාවන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය (අධිකාරියේ අනුමැතිය) ලබා නොගෙන 2022 ජනවාරි 01 සිට 2024 මාර්තු 31 දක්වා කාල සීමාව තුල කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.	2024 සැප්තැම්බර් මස සිට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති බැවින් ඉදිරියට ඒ අනුව කටයුතු කරන බව .	අනුමැතියකින් තොරව බඳවා ගැනිම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකළ යුතු ය.

1.5.6.3 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	------------------------------	-------------
2016 අංක 01 දරන පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය ප්‍රඥප්තියේ 02 වගන්තිය ප්‍රකාරව තේමා උද්‍යානය අරමුණු 12 ක් සාක්ෂාත් කර ගැනීම සඳහා	අනාගත උරුමයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩසටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය ඉටු කර ගැනීම සඳහා	මෙතෙක් ඉටුකරගෙන නොමැති අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කල යුතුය.

ආයතනය පිහිටුවාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අරමුණු 12 න් අරමුණු 07 ක් ඉටු කරගෙන නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරනු ලබන බව.	

1.5.7 ශීර්ෂය - 811- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
A සහ B ශ්‍රේණියේ මූලික රෝහලක තිබිය යුතු පහසුකම් පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 27 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-18-2020(1) මගින් පෙන්වා දී තිබුණද සබරගමුව පළාතේ බලංගොඩ සහ කරවනැල්ල මූලික රෝහල් A ශ්‍රේණියේ මූලික රෝහල් ලෙසත් ඇහැලියගොඩ, කොලොන්න, කලවාන සහ වරකාපොල යන මූලික රෝහල් B ශ්‍රේණියේ රෝහල් ලෙසත් නම් කර ඇතත් එකී රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල සපුරා නොතිබුණි.	A හා B ශ්‍රේණිවල මූලික රෝහල්වල අවශ්‍ය පහසුකම් සපයා නොතිබීමට ප්‍රධානතම හේතුවක් වී ඇත්තේ ඒ සඳහා අවශ්‍ය මානව සම්පත ප්‍රමාණවත් නොමැති වීමයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්ණායක හා අපගේ ඉල්ලීම් අනුව මෙම රෝහල්වල සිටින කාර්ය මණ්ඩලය සංශෝධනය සඳහා වරින් වර ඉල්ලීම් කර ඇතත් පසුගිය කාලයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විදේශගත වීම නිසා වෛද්‍යවරුන්ගේ හිඟතාවයක් පවතින බව.	රෝහල්වල භෞතික හා මානව සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතු ය.

1.5.8 ශීර්ෂය - 812- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව ඇතුළු ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා සතුව එකතුව අක්කර 17 කට ආසන්න භූමි ප්‍රමාණයක් පවතින අතර ඖෂධ වගාවට යොමු වී නොමැති රෝහල් සතු භූමි සඳහා උචිත ඖෂධ වර්ග හඳුනාගෙන ඒවා රෝපණය කිරීමටත්, රෝහල් වලට අවශ්‍ය වාර්ෂික ඖෂධ පරිභෝජනය ඇස්තමේන්තු කර සුදුසු ඖෂධ පැළ වගා කිරීමටත් කටයුතු කර නොතිබුණි.	ආර්ථිකමය වටිනාකමක් සහිත ඖෂධීය ශාක වගා කිරීමේ දී අනාරක්ෂිත බව, භූමියේ අයිතිය අප සතු නොවී, නඩත්තුව අපහසු වීම, වාර්ෂික ස්ථාන මාරු මගින් අලුතින් වෛද්‍යවරු ඒ ඒ ආයතනයන් වෙත ස්ථානගත වීමෙන් ආයතනයේ ඔසු වගාව පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට හා දැනුවත් වීමට කල් මැදවීම වැනි ගැටලු පවතින බව.	නිෂ්කාර්යව පවතින රෝහල් භූමි ඵලදායීව ඖෂධ වගාවට යොදා ගැනීම සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති ගැටළුවලට විසඳුම් සහිතව උචිත ව්‍යාපෘති පිළියෙළ කර කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

1.5.9 ශීර්ෂය - 813- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
සමුපකාර සංවර්ධන අරමුදල මගින් 2002 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුලදී සමූපකාර සමිති 04 ක් වෙත ලබා දුන් එකතුව රු. 2,350,000 ක් වූ ණය මුදලේ ණය ආපසු ගෙවීම අදාල සමිති විසින් පැහැර හැර තිබූ අතර 2025 මැයි 08 දිනට පොලිය ඇතුලත්ව එකතුව රු.3,165,078 ක ශේෂයක් එකී සමිතිවලින් අය විය යුතුව තිබුණි.	අක්‍රීය මට්ටමේ පවතින සමුපකාර සමිතිවල ණය තීරක විභාගයෙන් පසුව අයකරගත හැකි වීම. පොලී මුදල් කපා හැරීමට ආණ්ඩුකාරවර අනුමැතියට යොමුකර ඇති බව. ඈවර කිරීමට නියමිත සමිති ඈවර කටයුතු අවසන් වූ පසු ණය අයකර ගැනීමට හැකි බව.	අරමුදල මඟින් ලබා දී ඇති ණය නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

1.5.10 ශීර්ෂය- 820- පළාත් මාර්ග සංවර්ධනය,ග්‍රාමීය යටිතල පහසුකම් , සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු පළාත් අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
2016 හා 2017 වර්ෂයන්හිදී පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කොළොන්න ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21 ක ගෙවීම් කරන ලද වැය විෂයක් මඟින් ආවරණය වී තිබූ අට්ටි ගසන ලද පස් ඇතිරීම යන වැඩ විෂය අතිරේක වැඩ විෂයක් ලෙසද ඇතුලත් කර පස් ඝන මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු. 5,928,010 ක් අධි ඇස්තමේන්තුගත කර ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම එම වැඩියෙන් ගෙවීම් කර තිබූ මුදල් අයකර ගැනීමට සහ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධ විනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මගින් ඉටු කල ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 17.87 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබීම හා ව්‍යාපෘති 03ක් සඳහා රු. මිලියන 4.16 ක් නිශ්කාර්ය ලෙස වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය දක්වාම සාවද්‍ය ගෙවීම් අයකර ගැනීමට හා විනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.	විනය පරීක්ෂණ මේ වන විටත් සිදුකරමින් පවතී.	රජයට සිදු වී ඇති පාඩුව අයකරගත යුතු ය. වගකීම් විරහිත රාජකාරි කටයුතු සිදුකළ නිලධාරීන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගත යුතු ය.

1.5.11 ශීර්ෂය 821- පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
48 වන ජාතික ක්‍රීඩා තරඟාවලිය සඳහා සහභාගි වූ සබරගමුව පළාත නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පාවහන් මිල දී ගැනීම සඳහා විශේෂ මුල්‍යාධාරයක් ලබා දීමට 2024 ජුනි 24 දිනැති සීඑස් 03/01/ආ.කා. මාර්ග-2024 අංක දරන ලිපිය මඟින් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී තිබුණ ද ඊට පටහැනිව විශේෂ මුල්‍යාධාර ලබාදුන් ලෙස වවුචර්පත් සාවද්‍ය ලෙස සකස් කර මල්ලවපොර ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා දීමනාව වශයෙන් රු.8,500 බැගින් 24 දෙනෙකුට රු.204,000 ක් සහ පාපන්දු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 40 දෙනෙකු සඳහා රු.20,000 බැගින් රු.800,000 ක් ගෙවූ බවට දක්වා සාවද්‍ය ලේඛණ ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව 2024 ජුනි මාසයේ දී පාවහන් මිල දී ගෙන මුදල් නොව පාවහන් ක්‍රීඩකයින්ට ලබා දී තිබුණි.	විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු මෙම විගණන විමසුම සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	කූට ලේඛන සකස් කර ඇති බව නිරීක්ෂණය වන බැවින් අදාල නිළධාරින්ට විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර, මූල්‍යමය පාඩුවක් සිදු වී ඇත්නම් අයකිරීම් සිදුකළ යුතු ය.

1.5.12 ශීර්ෂය - 830 - සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක , ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය

1.5.12.1 පළාත් සමාජ සේවා අරමුදල

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	1994 අංක 04 දරන සබරගමුව පළාත් සභාවේ සමාජසේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 06 (iv) වන වගන්තිය අනුව අරමුදල් නිදහස් කිරීමේදී අසරණ හා ආබාධිත දරුවන්ට පෝෂණය, සෞඛ්‍ය හා අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීමට මුදල් නිදහස් කළ හැකි බව දක්වා තිබුණද 2024 වර්ෂයේ කිසිඳු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් අධ්‍යාපන ආධාර ලබා දී නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකින් පමණක් ප්‍රතිලාභීන් දෙදෙනෙකුට පෝෂණාධාර ලබා දී තිබූ බැවින් සබරගමුව පළාතේ මහජනතාවට පළාත් සමාජ සේවා අරමුදල මඟින් ප්‍රමාණවත් පිටුවහලක් ලැබී නොතිබුණි.	2024 වර්ෂයේදි ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2025 වර්ෂයේ සිට ඉදිරි කටයුතු සිදු කරගෙන යාමට කටයුතු කරන බව.	අරමුදලේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතු අතර, එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ / ගණන් දීමේ නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයක් සිදුකළ යුතු ය.

(ආ)	සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 7 වැනි වගන්තියේ බලතල ප්‍රකාරව සකස්කර අනුමත කරගත් රෙගුලාසීන්හි 24 වන රෙගුලාසිය අනුව වෙනත් කිසිදු ආධාර යෝජනා ක්‍රමයකින් ආධාර හෝ සහනාධාර ලැබී නැති ඉතාමත් අන්ත දුගී තත්ත්වයේ සිටින පවුල්වල පුද්ගලයන්ට සහනයක් සැපයිය හැකි වුවද, පළාතේ සමාජ සේවා නිලධාරින් මඟින් කිසිදු ආධාරයක් නොලබන පවුල් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර එවැනි පවුල් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අවශ්‍ය දත්ත ලබාගනිමින් කිසිදු ආධාරයක් නොලබන පවුල් හඳුනාගැනීමක් සිදු කිරීමට ඉදිරියේදී අපේක්ෂිත බව.	-එම-

1.5.13 ශීර්ෂය 831- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
වාර්ෂික ඇස්තමේන්තුව අනුව කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් වශයෙන් හඳුනාගෙන තිබූ පාරම්පරික හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය සහන සැලසීම, ව්‍යාප්ත කිරීම, දිරිගැන්වීම හා ඊට ආධාර දීම, තරුණ තරුණියන් පුහුණු කිරීම හා ස්වයං රැකියා සඳහා ආධාර කිරීම, කුඩා කර්මාන්තකරුවන් සහ පේෂ කාර්මිකයන් නඟා සිටුවීම, කර්මාන්ත සමීක්ෂණ කිරීම හා නව කර්මාන්ත ඇති කිරීම, ප්‍රදර්ශන පැවැත්වීම හා කර්මාන්තකරුවන් දිරිගැන්වීම යන කාර්යයන් ඉටු කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.	පාරම්පරික හස්තකර්මාන්තකරුවන් දිරිගැන්වීම හා නගා සිටුවීම සඳහා හස්තකර්මාන්ත තරඟ පවත්වා ඔවුන් අගැයීම, වෙළඳපල සපයා දීම වැනි කරුණු ක්‍රියාත්මක කර ඇත.	දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු සියළු කාර්යයන් ඉටු කිරීමට අවධානය යොමුකළ යුතු ය.

1.5.13.1 කර්මාන්ත සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනය පිහිටි ඉඩම 1990 වර්ෂයේ සිට කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් භුක්ති විඳින නමුත් 2025 දක්වා වන විටත් එහි අයිතිය පවරා ගෙන නොතිබුණි.	මෙම ඉඩම් කොටස ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලා ඇතත් මෙතෙක් එම කාර්ය ඉටුවී නොමැත. ඉදිරියේදී නැවත ඉල්ලීමක් කර මෙම කටයුතු කඩිනම් කිරීමට එකඟ වන බව.	ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනය තුළ 2025 මැයි වන විට සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු සහ කම්කරුවන් 18 දෙනෙකු සේවයේ යොදවා තිබුණ ද එය පිහිට වූ දින සිට වසර 35 ක් පමණ ගතව තිබුණ ද ඒ සඳහා කාර්යය මණ්ඩලය අනුමත කර ගෙන නොතිබුණි.	කාර්ය මණ්ඩලයක් අනුමත කර දෙන ලෙස 2021 වර්ෂයේ සිට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතත් මෙතෙක් එය අනුමතව නැත. ඉදිරියේදී සාධාරණීකරන වාර්තාවක්ද සමඟ එම ඉල්ලීම ඉදිරිපත් කිරීමට නව අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බව.	කාර්යය මණ්ඩලය අනුමත කර ගත යුතුය.

1.5.13.2 පේෂ කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	------------------------------	-------------
දෙපාර්තමේන්තුවේ අත්සළු ආයතනවල සිටින පේෂ කාර්මිකාවන්ට සාපේක්ෂව අත්‍යන්ත්‍රවල අතිරික්තයක් පවතින අතර මුළු පේෂකාර්මිකාවන් 282 දෙනෙක් අතුරින් 175 ක් වයස අවුරුදු 55 ට වැඩි කාර්මිකාවන් විය. තරුණ පේෂ කාර්මිකාවන් ආකර්ෂණය කරගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. තවද, කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි පිහිටි පේෂකර්ම මධ්‍යස්ථාන 02 ක් අක්‍රිය වීම හේතුවෙන් රු.4,128,000 ක වටිනාකමක් සහිත ගොඩනැඟිලි සහ උපකරණ හා රු.2,400,000 ක වටිනාකමක් සහිත ඉඩම් දිගු කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.	නව කාර්මිකාවන් බඳවා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට සහභාගී වී දැනුවත් කිරීම් කර ඇති බව.	පේෂ කර්මාන්තය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු ය.

1.5.14 ශීර්ෂය 832 - පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
------------------------	------------------------------	-------------
මුරුත්තෙට්ටුව පිරිමි ළමා රැඳවුම් මධ්‍යස්ථානය සඳහා රු.17,095,205 ක් වැයකර ඉදිකර තිබූ තෙමහල් උපදේශන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2019 සැප්තැම්බර් 26 දින විවෘත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයට ගෙන නොතිබුණි.	මෙම මධ්‍යස්ථානය සාමාන්‍යයෙන් දරුවන් 15 කට අඩු සංඛ්‍යාවක් රැඳවීම කරනු ලබන අතර සමහර අවස්ථා වල 10 ටත් අඩු අතර එවන් අවස්ථාවක උපදේශනය සඳහා වෙනත් උපදේශන මධ්‍යස්ථානයකට රැගෙන යාමට අවශ්‍ය නොවේ. දැනට නේවාසික ළමුන් සඳහා බිම් මහලේ සැලුන් පාඨමාලාවක් හැදෑරීම සඳහා සැලුන් එකක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති බව.	1.ගොඩනැඟිලිවල උපයෝජනය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අදාල ඉදිකිරීමේ සැලසුම් සකස් කළ යුතු ය. 2. වැයකර ඇති මුදලට සාපේක්ෂ ප්‍රතිලාභ ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කළයුතු ය.

1.5.15 ශීර්ෂය - 840- අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු පළාත් අමාත්‍යාංශය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	බොරාල පාසැල් කෘෂි පුහුණු මධ්‍යස්ථානය මූලික අරමුණු 10 ක් වෙනුවෙන් ස්ථාපනය කර තිබූ අතර, 2006 සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 18 ක් තුළ ඉන් මූලික අරමුණු 02 ක් පමණක් ඉටුකර ගැනීමට කටයුතු කර තිබුණි. තවද පාසැල් වැඩසටහන් 26 ක් දින 26 ක් තුළ පවත්වා තිබුණු අතර, 2024 අප්‍රේල් 01 සිට සිසුන් 11 දෙනෙකු සඳහා NVQ අවසන් විභාගය වෙනුවෙන් පුහුණු වීම් කටයුතු සිදුකර තිබෙනු නිරීක්ෂණය වූ අතර, වර්ෂය පුරාවටම වැඩසටහන් පැවැත්වීමට කටයුතු සැලසුම්කිරීමෙන් මෙම ආයතනය ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ කලාප අධ්‍යාපන කාර්යාල හරහා වැඩසටහන් සංවිධානය කර එම පුහුණු කිරීම් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව.	පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණු කරා ළඟා වීමට කටයුතු කළ යුතු ය.
(ආ)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ පොත් අල්මාරි මිල දී ගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ 05 කොන්දේසිය ප්‍රකාරව 2023 නොවැම්බර් 28 දිනට පෙර භාණ්ඩ බෙදා හැරීම් සිදුකර අවසන් කළ යුතු වුවද, 2024 අප්‍රේල් 05 දින තෙක් බෙදා හැරීම අවසන් කර නොතිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු ලෙස රු.306,577 ක් අයකළ යුතු වුවද, එසේ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකළ යුතු ය.
(ඇ)	පරිගණක පුටු, පරිගණක මේස, ගුරුපුටු සහ වානේ ගුරු මේස මිල දී ගැනීමට අදාල ලංසු ලේඛනවල හා කොන්ත්‍රාත් ගිවිසුමේ උපකරණ පාසල් වෙත බෙදා හැරිය යුතු කාලය දක්වා තිබූ අතර, විගණනය විසින් පරීක්ෂා කළ පාසල් 06 කට ප්‍රමාද වී උපකරණ බෙදා දී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව ඊට අදාලව අයකළ යුතු රු.972,497 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.	පරිගණක පුටු, පරිගණක මේස ,ගුරු පුටු හා වානේ මේස සැපයිය යුතුව තිබූ දිනට සැපයීමට නොහැකි බව දන්වා කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කර තිබූ අතර 2023.12.30 දක්වා දින දීර්ඝ කර ලබා දී ඇති අතර ප්‍රමාද ගාස්තු අයකිරිමට පදනමක් නොමැති බව.	1. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු ය. 2. ප්‍රමාදය නොසලකා ගෙවීම් කර තිබේ නම් ඒ තුලින් රජයට සිදු වූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඈ)	පාසැල් 30 ක් සඳහා ගණිත සහ ඉංග්‍රීසි ක්‍රියාකාරකම් කාමර සකසා සිසු භාවිතය සඳහා භාර දී තිබිය දී, නැවත විවෘත කිරිමේ කටයුතු සඳහා සමරු ඵලක , පුවත්පත් දැන්වීම් සහ සංග්‍රහ වියදම් ලෙස රු.639,465 ක් වැය කර තිබුණි.	ගරු ආණ්ඩුකාරතුමා විසින් පළාත් සභාව මගින් සිදු කර ඇති ආයෝජනය පිළිබඳව පළාතේ ජනතාව දැනුවත්විය යුතු බව අවධානය කර තිබූ අතර , පුවත්පත් දැන්වීම ප්‍රධාන ලේකම්තුමාගේ අනුමැතිය සහිතව මෙම අමාත්‍යාංශය වෙත අදාල ගෙවීම් සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.ඒ අනුව ව්‍යාපෘතියට අදාල පරිපාලන වියදම් මගින් ඉහත වියදම් දරන ලද බව.	රජයේ මුදල් නිෂ්ඵල ලෙස වැය කිරීම නොකළ යුතු ය.
(ඉ)	දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ සිසුන් 03 සිට 924 දෙනෙක් දක්වා පරාසයක ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන පාසැල් 49 ක සිසුන්ට හා ගුරුවරුන්ට ප්‍රමාණවත් ජල පහසුකම් නොතිබුණි.	පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව.	සියළු පාසල්වල මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කඩිනමින් පියවර ගත යුතු ය.

1.5.15.1 සබරගමුව පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
	-------------------------	-------------------------------	-------------
(අ)	සබරගමුව පළාත තුළ සියළුම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, නියාමනය හා අධීක්ෂණය අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය වුවද, 2024 දෙසැම්බර් 31 දිනට පැවති පෙර පාසල් 1,500 කින් පෙර පාසල් 519 ක් සමාලෝචිත වර්ෂය සඳහා ලියාපදිංචිය ලබා දීමේදී සලකා බලන මූලිකම නිර්ණායකයක් වන අදාළ පෙර පාසල් ගුරුවරියන් ඩිප්ලෝමා පාඨමාලාව හදාරා නොතිබීම මත ලියාපදිංචිය යාවත්කාලීන කර නොතිබුණ ද එකී පෙර පාසැල් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	මූලිකම නිර්ණායකය වන අදාළ පෙර පාසල් ගුරුතුමියන් පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාව හදාරා නොමැති වීම දැක්විය හැකිය . අදාළ නිර්ණායක සම්පූර්ණ කර ගැනීම සඳහා මේ වන විට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව.	ලියාපදිංචිය යාවත්කාලීන කරවීම සඳහා අධිකාරිය මැදිහත් විය යුතු ය.
(ආ)	පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව පළාත් බලධාරීන් මගින් කාර්යයන් ඉටු කිරීමේ දි, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පළාත් සැලසුම් ක්‍රියාවට නැංවීමේ දී ඒ සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ සහ එහි තත්ත්වය පිළිබඳව මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුව හරහා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කිරීම කළයුතු වුවත්, එසේ වාර්තා කර නොතිබුණි.	දැනට ජාතික කමිටුවේදී පළාතක් ලෙස අදාළ කරුණු දක්වා ඇත.එසේ වුවද ඔබේ නිරීක්ෂණ පදනම් කර ගනිමින් අදාළ කරුණු මෙම වර්ෂයේ සිට ලිඛිතව ජාතික කමිටුවට වාර්තා කිරීමට කටයුතු කරන බව.	පළාත් සැලසුම් ක්‍රියාවට නැංවීමේ දී ඒ සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ ජාතික සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කිරීම කළයුතු ය.

(ඇ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 සැප්තැම්බර් 06 දිනැති DMS/SG/05/1 අංක දරන ලිපිය මඟින් අධිකාරිය සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 02 ක් සහ ප්‍රාථමික තනතුරු 2 ක් ලෙස මුළු තනතුරු 05 ක් අනුමත කර තිබුණ ද එම තනතුරු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සංවර්ධන නිලධාරීන් 04 දෙනෙක් සහ අධ්‍යක්ෂකවරයෙක් අනුයුක්ත පදනමින් සේවය කරමින් පැවැතිණි.	මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම කරුණ ඉදිරිපත් කර මේ පිළිබඳ තීරණයක් ගැනීමට කටයුතු කරන බව.	අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර අධිකාරියේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගත යුතු ය.

1.5.16 ශීර්ෂය 841- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.6 ඡේදය ප්‍රකාරව දෙහිඕවිට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් නිල නිවාස වලින් අයකරනු ලබන ආර්ථික කුලිය වර්ෂ 05 කට අධික කාලයක් තුල සංශෝධනය නොකර පැරණි ආර්ථික කුලියම අයකරමින් පැවතුණි.	නිල නිවාස සියල්ල අලුතින් තක්සේරු කිරීමට කටයුතු කරන බව.	ආර්ථික කුලිය කාලීනව තක්සේරු කර අයකළ යුතු ය.
(ආ)	කලාප අධ්‍යාපන කාර්යාල 04 කට අදාලව එහි අධීක්ෂණය යටතේ සිදුකරන ලද පාසල් 32 ක සහ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයක අලුත්වැඩියාවන්ට අදාලව වැඩ විෂයයන් 77 ක් සඳහා එකතුව රු.15,569,045 ක් ගෙවා තිබූ අතර, විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේ දි එකතුව රු.1,212,697 ක් වැඩිපුර ගෙවීම් සිදුකර තිබූ බව තහවුරු වුවද එකී වැඩිපුර ගෙවීම් අදාල තාක්ෂණ නිලධාරීන් විසින් හඳුනාගෙන නොතිබූ අතර මිනුම් නිවරදි බවට ඔවුන් සහතික කර තිබුණි.	වැඩිපුර අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	1. අවසන් බිල් සහතික කිරීමේ ක්‍රියාවලිය වඩා විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. 2. වැඩිපුර ගෙවීම් සහතික කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු ය.

1.5.17 ශීර්ෂය 850- ඉඩම්, පළාත් වාරි මාර්ග , කෘෂිකර්ම , සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පළාත් අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
පළාත තුළ සිටින විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් පිළිබඳ දත්ත පද්ධතියක් අමාත්‍යාංශය තුළ නොතිබූ අතර, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ සංවර්ධන අවශ්‍යතා, සහනාධාර ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රමවේදයන්, ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්නායක පිළිබඳ අවධානය යොමු කර නොතිබීම හේතුවෙන් 2024 වර්ෂයේදී සබරගමුව පළාතේ ජලජීවී කළමනාකාර බලපත්‍ර ලබා ගත් ව්‍යවසායකයින් 190 ක් ලියාපදිංචි වී ඇති නමුදු සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබූ රු.3,500,000 ප්‍රතිපාදනයෙන් ප්‍රතිලාභීන් 17 දෙනෙකු සඳහා පමණක් සහනාධාර ලෙස රු.1,549,592 ක් ලබා දී තිබුණි.	ඉදිරියේදී ජාතික ජලජජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ඒ සඳහා නිර්නායක ලැයිස්තුවක් සකස් කරන ලෙස හා දැනට පරිගණක ගතව පවත්වා ගෙන යනු ලබන දත්ත පද්ධතිය යාවත්කාලීන කොට පවත්වා ගෙන යන ලෙස සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) වෙත උපදෙස් ලබා දී ඇති බව.	වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.

1.5.18 ශීර්ෂය - 851 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ)	රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුවගම පොත්ගුල් කන්දෙහි සමගිපුර 182 C ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මිරිස්හේන මූකලාන නැමති ඉඩමෙන් පර්චස් 20 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත සන්නිවේදන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 1995 ජනවාරි 03 දින දීර්ඝ කාලීන බදු අනුමැතිය ලබා ගැනීමට යටත්ව නිදහස් කර වසර 30 ක කාලයක් ගතවී තිබුණද එකී ඉඩම් කොටසෙන් දීර්ඝකාලීන බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සන්නිවේදන ආයතනය විසින් ඉඩම් කොටස වාණිජ කටයුත්තකට යොදා ගෙන ඇති බැවින් දීර්ඝ කාලීන බදු අනුමැතිය ලබා දී බදු අයකර ගැනීම කළ යුතුය.
(ආ)	යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූ.පි.කෑ.2868 හි කට්ටි අංක 05 වශයෙන් දැක්වෙන රජයේ ඉඩමෙන් හෙක්ටයාර් 2.161 ක ඉඩම් කොටසක් 2002 මාර්තු 22 දින සිට සී/ස ස්වාධීන රූපවාහිනී ආයතනයට විකාශන මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීම සඳහා බදු ලබා දී තිබුණ ද ස්වාධීන	අදහස් දක්වා නොතිබුණි.	හිඟ බදු මුදල වාරික වශයෙන් හෝ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

රූපවාහිනී ආයතනය විසින් 2008 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැර තිබීමෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.10,189,120 ක බදු මුදලක් හිඟව පැවතුණි.

1.5.19 ශීර්ෂය 852 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්	නිර්දේශය
2020 වර්ෂයේදී පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ ප්‍රධාන වශයෙන් පොල් වගාකර ඇති මාරුක්වතුර ගොවිපල 2021 සිට අඛණ්ඩව මූල්‍යමය පාඩු වාර්තා කර 2024 වර්ෂයේ දී රු. මිලියන 13 ක මූල්‍යමය පාඩුවක් ලබා තිබූ අතර පළාත් සභා අරමුදලට මූල්‍යමය පාඩුවක් සිදුකරමින් පවතින ගොවිපල ලාභ ලබන මට්ටමට ගෙන ඒම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා ගණන්දීමේ නිලධාරියාගේ අවධානය යොමු වී නොතිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත පාඩුව රු.21,506,096 ක් වී තිබුණි. තවද, 2025 ජූලි මස පොල් අස්වැන්නෙන් වටිනාකම රු.78,600 ක් වූ පොල් ගෙඩි 600 ක ප්‍රමාණයක් ගොවිපල එළදා ලේඛනයට ඇතුලත් නොකර මුදල් ලබා ගැනීමකින් තොරව ගොවිපල කළමනාකරු විසින් කෑගල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය වෙත බැහැර කර තිබූ බවට විගණනයට නිරීක්ෂණය වූ බැවින් ගොවිපලේ පොල් එළදාව අවභාවිතාවන්ට ලක්වන බවත් ඉහත සඳහන් පරිදි ප්‍රමාණාත්මක මූල්‍යමය පාඩු ඇතිවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති බවත් නිරීක්ෂණය විය. තවද, අක්කර 33 ක් වූ සමස්ත ගොවිපල භූමි ප්‍රමාණයෙන් අක්කර 27 ක් පමණක් උපයෝජනය කර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ගොවිපල මූල්‍යමය පාඩු ලැබීමට හේතු හඳුනාගැනීම, නව තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ භාවිතයට යොමුවීම, කම්කරු පුහුණුව හා ඌන උපයෝජිත ගොවිපල භූමිය සමස්ත ලෙස උපයෝජනය කිරීම තුලින් ආදායම් වැඩි කර ගැනීම කළ යුතු ය.